# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,563 - 2008 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2008.08.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | -- | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1003 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අගෝස්තු මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ II "ආ" පන්තියේ ව්‍යාප්ති නිලධාරි සහ පර්යේෂණ සහකාර තනතුරට නිලධාරීන් බඳවා ගැනීමේ තරග විභාගය - 2008

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවමින් 2008.07.25 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ 05 ඡේදයේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව දැක්වෙන අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම් යටතේ පහත දැක්වෙන සුදුසුකම් ද ඇතුළත් කර එම අයදුම්පත් කැඳවීමේ නිවේදනය මතු දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

*අ.පො.ස. (උ. පෙළ) :-*

සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විද්‍යා විෂයයන් 02 ක් සමග විද්‍යා විෂයයන් 03 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (පැරණි නිර්දේශය) එකවර සමත්වීම;

හෝ

ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් 02 ක් සමග විද්‍යා විෂයයන් 03 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (නව නිර්දේශය) එකවර සමත්වීම.

මේ අනුව මෙම තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2008.09.15 දින තෙක් දීර්ඝ කරනු ලැබේ.

ඩබ්. ඩී. එල්. ගුණරත්න,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ *(වැ. බ.)*

08-596

---

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2008 සැප්තැම්බර්**

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත්විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2008 සැප්තැම්බර් මස 28 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* - මෙම විභාගයට අයදුම්කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. *අයදුම්පත්* - මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2008 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු :*

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම :*

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය :

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය,
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය,
(ඇ) රියදුරු බලපත්‍රය,
(ඈ) ගමන් බලපත්‍රය.

(ii) කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයාගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය. (වෙබ් අඩවිය - WWW.health.gov.lk)

06. *විභාග පරිපාටිය.-* මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්‍ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතුයි එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ අදාළ සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

07. *විභාග නිර්දේශ මාලාව :*

07:1 *ලිඛිත විභාගය*

07:1:1 *ආයතන සංග්‍රහය*

කාලය පැය 02 යි. ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි.

*විෂය නිර්දේශය* :

(i) *ආයතන සංග්‍රහය*

*(අ)* I කොටස - II, III,V,VI,VII VIII,IX,XI,XII,XIII,XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද ;

*(ආ)* II කොටස - XLVII සහ XLVIII වැනි පරිච්ඡේද;

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි;

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය.

7:1:2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය*

කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

*විෂය නිර්දේශය* :

*සෞඛ්‍ය සේවා සංග්‍රහය* :

I වැනි කොටස - වෛද්‍ය සේවා

II වැනි කොටස - රසායනාගාර සේවා

7:1:3 *ගිණුම්* :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

*විෂය නිර්දේශය* :

(i). මුදල් රෙගුලාසි - I වැනි කොටස

| | | | |
|---|---|---|---|
| පරිච්ඡේද | I | - | සියළුම වගන්ති |
| | II | - | සියළුම වගන්ති |
| | III | - | සියළුම වගන්ති |
| | IV | - | සියළුම වගන්ති |
| | V | - | 1,2,3,4 සහ 6 වගන්ති |
| | VI | - | සියළුම වගන්ති |
| | VII | - | 1,2,3,4 සහ 6 වගන්ති |

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි.

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්.

(iv) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි.

7:2 *සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :*

සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100කි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

වෛද්‍ය යූ. අජිත් මෙන්ඩිස්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
*සෞඛ්‍ය ලේකම් වෙනුවට.*

2008 ජූලි මස 23 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි | |
|---|---|

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2008 සැප්තැම්බර්**

01. (අ)(i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන්, මුලකුරු අගට යොදා ලියන්න) :————.

(ii) අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න) :-

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :-

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |

(ආ)(i) නිල නාමය (වෛද්‍ය නිලධාරී/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී) :————.

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම් ලද දිනය:————.

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓)ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් ( X) ලකුණ යොදන්න. :

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | | රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | | ගිණුම් | |
| සිංහල වාචික | | දෙමළ වාචික | | | |

03. (අ) දැන් සේවය කරන ආයතනය :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) ඔබට විභාගයට පෙනී සිටීමට හැකි ආසන්නතම හෙද විදුහල :————.

(ඈ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ, දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර, එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ).

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | |
| කුරුණෑගල | | අනුරාධපුරය | | රත්නපුරය | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | |

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද ? :————.

(ඉ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද?:————.

(ආ) ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද ? :————.

| මුද්දර කොටුව |
|---|

06. අයදුම්කරුගේ සහතිකය :

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ......... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්*, මෙම ඉල්ලුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..................මහතා/මිය/මෙනවිය* මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු වන අතර, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන* බවට ද රු. ......... ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද *මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

**විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය**

............ මහතා/මිය./මෙනවිය* වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු *වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ * සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(*අනවශ්‍ය කොටස් කපා හරින්න)

08-602

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නන්ගේ ප්‍රවීණතා සහතිකය සඳහා වූ පරීක්ෂණය

*ප්‍රවීණතා සහතිකයේ වර්ග :*

(අ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ උසස් පන්තියේ ප්‍රවීණතා සහතිකය,

(ආ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ සාමාන්‍ය පන්තියේ ප්‍රවීණතා සහතිකය,

(ඇ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ නවක පන්තියේ "අ" ප්‍රවීණතා සහතිකය,

(ඈ) ආධුනික ගුවන් විදුලි ක්‍රියාකරවන්නෙකුගේ නවක පන්තියේ "ආ" ප්‍රවීණතා සහතිකය.

2. *ඇතුළත්වීම සඳහා අවම අවශ්‍යතා.-* විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයෙකුටම පහත දැක්වෙන අවම මූලික සුදුසුකම් තිබිය යුතුය.

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂකයින්ගේ වයස අවුරුදු දාහතර (14) හෝ ඊට වැඩි හෝ විය යුතු ය.

3. *පරීක්ෂණයේ පටිපාටි.-* (අ) උසස් පන්තිය.- පරීක්ෂණය කොටස් දෙකකින් (2) සමන්විත වේ.

*1 වැනි කොටස.-* පරීක්ෂණයකට පෙනී සිටින එක් වරකදී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතු ය.

*I වැනි ප්‍රශ්න පත්‍රය.-* උසස් විදුලි තාක්ෂණය සහ ගුවන් විදුලි සන්නිවේදනය (පැය 03) ;

*II වැනි ප්‍රශ්න පත්‍රය.-* බලපත්‍රදීමේ කොන්දේසි මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 02 යි).

*2 වැනි කොටස.-* ප්‍රායෝගික මෝස් සංඥා පරීක්ෂණය (විනාඩියකට වචන 20).

(ආ) *සාමාන්‍ය පන්තිය.-* පරීක්ෂණය කොටස් දෙකකින් සමන්විත වේ.

*I වැනි කොටස .-* පරීක්ෂණයට පෙනී සිටින එක් වරකදී අනිවාර්යය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට උත්තර ලිවිය යුතුය.

*I වැනි ප්‍රශ්න පත්‍රය.-* ගුවන් විදුලි සන්නිවේදනය සහ විදුලි ශිල්පය පිළිබඳ මූලික කරුණු (පැය 02);

*II වැනි ප්‍රශ්න පත්‍රය.-* බලපත්‍රදීමේ කොන්දේසිය මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01 යි).

*2 වැනි කොටස.-* ප්‍රායෝගික මෝස් සංඥා පරීක්ෂණය (විනාඩියකට වචන 12).

(ඇ) *නවක පන්තිය.-* "අ" විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

*I වැනි කොටස.-* පරීක්ෂණයට පෙනී සිටින එක් වරක දී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට (2) උත්තර ලිවිය යුතුය ;

*I වැනි ප්‍රශ්න පත්‍රය.-* මූලික විදුලි ශිල්පය, ගුවන් විදුලි සහ විද්‍යුත් සිද්ධාන්ත (පැය 02) ;

*II වැනි ප්‍රශ්න පත්‍රය.-* බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01 යි).

2 *වැනි කොටස.-* ප්‍රායෝගික මෝස් සංඥා පරීක්ෂණය (විනාඩියකට වචන 05).

(ඈ) *නවක පන්තිය.-* "ආ" පරීක්ෂණයට පෙනී සිටින එක් වරක දී අනිවාර්ය ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකට (2) උත්තර ලිවිය යුතුය ;

*I වැනි ප්‍රශ්න පත්‍රය.-* මූලික විදුලි ශිල්පය, ගුවන් විදුලි සහ විද්‍යුත් මූලධර්ම (පැය 02) ;

*II වැනි ප්‍රශ්න පත්‍රය.-* බලපත්‍ර දීමේ කොන්දේසිය, මෙහෙයුම් පරිචය සහ කාර්ය පරිපාටිය (පැය 01 යි).

නවක පන්තිය "අ" වර්ගයේ බලපත්‍රයක් සඳහා මෝස් පරීක්ෂණය අවශ්‍ය නොවේ.

4. *පරීක්ෂණයේ කොන්දේසි.-* සියලුම වර්ගවල ප්‍රවීණතා සහතික සම්බන්ධයෙන් පහත දැක්වෙන කොන්දේසි බලපානු ඇත.

(i) අපේක්ෂකයින් පරීක්ෂණයෙන් සමත්වීමට (පරීක්ෂණයේ සියළුම කොටස්වලින් සමත් විය යුතුය) ;

(ii) පරීක්ෂණයේ දී 1 වැනි කොටස එක් වාරයකින්ම සමත් විය යුතුයි. (පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමත්විත විය යුතුයි) ;

(iii) පරීක්ෂණයේ දී 1 වැනි කොටසින් සමත්වන අපේක්ෂකයින්ට පමණක් 2 වැනි කොටසට පෙනී සිටීමට (මෝස් පරීක්ෂණයට) ඉඩ දෙනු ලැබේ ;

(iv) 1 වැනි කොටසින් සමත්වන අපේක්ෂකයින්ට ඊට පසුව පැවැත්වෙන පරීක්ෂණයේ දී 2 වැනි කොටස (මෝස් පරීක්ෂණය) සඳහා පමණක් අයදුම් කළ හැකි ය.

5. *පෙනී සිටින මාධ්‍ය.-* විභාගය පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

6. *විභාග ගාස්තු.-* මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන්නාවූ ඉල්ලුම්කරු විසින් නිවේදනයේ දක්වා ඇති පරිදි විභාග ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය වේ නම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අමතන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

*පරීක්ෂණ ගාස්තු.-* ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නමට මුදල් ඇණවුමකින් හෝ ඕනෑම බැංකුවකින් අණකරයක් මගින් ගෙවිය යුතු ය.

ඇතුළත්වීම සඳහා ඉල්ලුම්පත් ලේඛන ගතකොට භාරදීමෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවිය යුතුය. ඇතුළත්වීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය තැපැල් කළ බවට හෝ භාරදුන් බවට හෝ සාක්ෂි ඉදිරිපත් කළහොත් මිස, එය තැපැල් කළ බවට, නැතහොත් භාරදුන් බවට කරන හිමිකම් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන හෙයින් නිල කුවිතාන්සිය තමන් ළඟ තබා ගත යුතු ය.

පරීක්ෂණ ගාස්තු ආපසු නොගෙවන අතර පසු දිනක පවත්වනු ලබන වෙනත් පරීක්ෂණයකට පවරනු ලැබිය නොහැකිය. ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගන්නා වු හෝ මොනයම් හේතුවක් නිසා හෝ පරීක්ෂණයකට පෙනී සිටීමට නොහැකි වන්නාවු හෝ ඕනෑම අපේක්ෂකයකු පසුව පවත්වනු ලබන පරීක්ෂණය සඳහා අදාළ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතුය.

| *පරීක්ෂණයේ වර්ගය* | *1 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* | *2 වැනි කොටස සඳහා ගාස්තු රු. ශත* |
|---|---|---|
| උසස් පන්තිය | 276 | 138 |
| සාමාන්‍ය පන්තිය | 138 | 138 |
| නවක පන්තිය (අ) | 138 | 69 |
| නවක පන්තිය (ආ) | 138 | - |

7. *අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.*- සෑම අවුරුද්දකට ම තුන් වතාවක් පෙබරවාරි, ජූනි සහ ඔක්තෝබර් මාසවල පරීක්ෂණය පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය, විභාග කොමසාරිස්තුමා විසින් දක්වනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගත් නිසි ඇතුළත්වීමේ ආකෘතියෙහි ඉල්ලුම්පත්‍ර ඇතුළත්වීමේ අවසාන දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්, අංක 276, ඇල්විටිගල මාවත, මැනිංටවුන්, කොළඹ 08.

| *සහතිකයේ වර්ගය* | *ඇතුළත්වීමේ අවසාන දිනය* |
|---|---|
| උසස් පන්තිය | 2008.09.19 |
| සාමාන්‍ය පන්තිය | එම |
| නවක පංතිය | එම |

8. *සහතික කිරීම.*- පහත සඳහන් අයගෙන් කෙනෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

සාමදාන විනිශ්වයකාරවරයෙක්, දිවුරුම් කොමසාරිස්වරයෙක්, නීතිඥවරයෙක් සහ නොතාරිස්වරයෙක්, යුද්ධ හමුදාවේ හෝ නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධරයෙක්, පොලීසියේ රාජ්‍ය නිවේදිත (ගැසට් කළ) නිලධරයෙක්, වර්ෂයකට රු. 493,920 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන තැනැත්තෙක්.

අනෙකුත් සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. *අපේක්ෂකයින් හඳුනා ගැනීම.*- පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීමට අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට සිදුවන අතර මේ කාර්ය සඳහා පහත දැක්වෙන ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

*(අ)* තැපැල්පතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් ;
*(ආ)* වලංගු ගමන් බලපත්‍රයක් ;
*(ඇ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රයක්.

1968 අංක 25 දරන විභාග පනතේ විධිවිධානවලට අනුකූලව සියලුම අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

මෙම නීති සහ නියෝග යටතේ විධිවිධාන සළසා නොමැති, යම් කරුණක් වේ නම්, එය විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි නිරාකරණය වන්නේ ය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්.

2008 අගෝස්තු මස 22 වැනි දින,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
මැනිං ටවුන්,
කොළඹ 08.

08-609

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.